# තැපැල් දෙපාර්තමේන්තුව

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

තැපැල් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා එම අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස සුදුසු සැපයුම්කරුවන් පහත සඳහන් පළාත් වලින් ලියාපදිංචි කරනු ලැබේ.

**ලියාපදිංචි කරනු ලබන පළාත් :**

A. බස්නාහිර පළාත
B. ඌව පළාත
C. නැගෙනහිර පළාත
D. මධ්‍යම පළාත
E. උතුරු පළාත
F. වයඹ පළාත
G. උතුරු මැද පළාත
H. දකුණු පළාත
I. සබරගමු පළාත

**ලියාපදිංචි කරනු ලබන භාණ්ඩ හා සේවා අයිතම**

භාණ්ඩ අයිතමයන්

01. ලිපි ද්‍රව්‍ය
02. විදුලි උපාංග
03. පරිගණක යන්ත්‍ර (Desktop, Tab, Laptop)
04. පරිගණක අමතර කොටස්
05. පරිගණක මෘදුකාංග
06. මුද්‍රණ යන්ත්‍ර (Printer, Scanner, Photocopy machine)
07. කාර්යාල යන්ත්‍ර උපකරණ සහ උපාංග
08. කිරුම් මිණුම් උපකරණ
09. තැපැල් මළු වැසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (තෙල්ගාර ලණු, ටින් ඩොකට්, මුද්‍රා ලාකඩ ,ඊයම් මුද්‍රා සහ ආරක්ෂිත ප්ලාස්ටික් මුද්‍රා)
10. විෂබීජ නාශක දියර හා සනීපාරක්ෂක ද්‍රව්‍ය
11. ගොඩනැඟිලි ද්‍රව්‍ය
12. කාර්යාලීය ගෘහ භාණ්ඩ (Office Furniture)
13. වායු සමීකරණ යන්ත්‍ර
14. රබර් මුද්‍රා, දින මුද්‍රා හා පොලිමර් මුද්‍රා
15. පිත්තල මුද්‍රා (තැපැල් මළු වැසීම සඳහා භාවිතා කරනු ලබන පිත්තල මුද්‍රා)
16. තැපැල් මුද්‍රා යන්ත්‍ර සඳහා තින්ත (Frama, FM-100 සහ Posmart යන්ත්‍ර සඳහා)
17. කැන්වස් රෙදි සහ Polypropylene
18. මළු මහන මැෂින්
19. පොලිසැක් මළු
20. කැන්වස් මළු/ සවල් මළු/සම් මළු ඇතුළු සියලුම වර්ගයේ බෑග්
21. නිල ඇඳුම් සඳහා රෙදි
22. මසා නිම කල නිල ඇඳුම්
23. සපත්තු සහ මේස්
24. කුඩ, වැහි කබා, තොප්පි
25. සියළුම වර්ගයේ වාහන සඳහා ටයර්, ටියුබ් හා බැටරි
26. සියලු වර්ගයේ මෝටර් රථ අමතර කොටස්
27. තෑගි භාණ්ඩ හා ප්‍රවර්ධන භාණ්ඩ (ටී ෂර්ට්/ කැප්/ බෑග්/ සමරු ඵලක ආදිය මුද්‍රණය කිරීම)
28. ඇතුලත ඇසුරුම් සහිත කවර (Padded Envelop) සහ පාර්සල් ඇසුරුම් පෙට්ටි සැපයීම ( Corrugated Boxes ඇතුළුව)
29. මුද්දර සුරැකුම් පොත්,මුල් දින කවර සුරැකුම් පොත්, මුද්දර ඇසුරුම් පත් හා මුද්දර රඳවන
30. පොලිතීන් ආශ්‍රිත නිශ්පාදන/ සෙලෝෆේන් (මුද්දර හා සමරු පත්‍රිකා රඳවන)
31. ජෙනරේටර

32. රෙදි ලණු බෝල
33. ලිහිසි තෙල්
34. දැව් තෙල්
35. දින මුද්‍රා තැටි හා දින මුද්‍රා කොට්ට
36. දින මුද්‍රා තීන්ත
37. ඇඟිලි සලකුණු යන්ත්‍ර
38. මුද්‍රිත අයිතම
39. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ යන්ත්‍ර සූත්‍ර සහ මෙවලම් (Tools)
40. පුද්ගලික ආරක්ෂණ උපකරණ (Personal Protection Equipment – PPE)
41. ගෘහ උපකරණ හා මුළුතැන්ගෙයි උපකරණ (Home Appliances & Kitchen Appliances)

සේවා හා ඉදිකිරීම් අයිතමයන්

1. ගොඩනැගිලි අළුත්වැඩියාව,කාර්යාල වෙන් කිරීම, ජල නල පද්ධතිය අළුත්වැඩියාව, විදුලි පද්ධති අළුත්වැඩියා හා සුළු නඩත්තු කටයුතු - රු.20,000,000.00 ක උපරිමයක් දක්වා සහ ඉදිකරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරී විසින් නිකුත් කරනු ලබන සහතිකය (CIDA) සමඟ අයදුම්පත ඉදිරිපත් කළ යුතුය
2. පරිගණක මෘදුකාංග
3. නාම පුවරු සැකසීම/ මුද්දර පුවරු අළුත්වැඩියා කිරීම
4. නිල ඇඳුම් මැසීම
5.වාහන අළුත්වැඩියාව - යාන්ත්‍රික වැඩ, ඩීසල් පොම්ප අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම
6.වාහන අළුත්වැඩියාව - වාහන වායු සමීකරණ අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම
7. වාහන අළුත්වැඩියාව - වාහන ටින්කරින් හා පේන්ට් වැඩ
8. වාහන අළුත්වැඩියාව - වාහන කුෂන් වැඩ හා අප්හොස්ට්‍රි වැඩ
9. වාහන සේවා කිරීම හා සේදීම
10. පාපැදි, යතුරුපැදි සහ ත්‍රිරෝද රථ අළුත්වැඩියාව
11. පරිගණක අළුත්වැඩියා කිරීම හා නඩත්තුව, ඡායා පිටපත් යන්ත්‍ර/ යතුරුලියන/ රෝනියෝ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා නඩත්තුව හා සේවා කිරීම.
12. වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම
13.පුටු විවීම, කාර්යාලීය උපකරණ (ලී සහ වානේ ඇතුළුව) අළුත්වැඩියාව හා නඩත්තුව කිරුම් මිණුම් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව
14.ලී හා කොන්ක්‍රීට් ලියුම් පෙට්ටි සැකසීම හා අළුත්වැඩියා කිරීම
15. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා වලින් මුද්‍රණ කටයුතු සිදුකිරීම ( විසිතුරු තිළිණපත්. ලිපි කවර, මුල්දින කවර, විවිධ වර්ගයේ පොත්, දැන්වීම්, පෝරම ආදිය)
16. බාර්කෝඩ් ලේබල් මුද්‍රණය
17. තැපැල් මළු සහ තැපැල් භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය වාහන කුලී පදනම මත සැපයීම
18. ප්‍රචාරක හා ප්‍රවර්ධන කටයුතු/ නිර්මාණාත්මක සැලසුම් හා ආකෘති ඉදිකිරීම
19. ආහාරපාන හා කේටරින් පහසුකම් සැපයිම
20. තැපැල් මුද්‍රා යන්ත්‍ර අළුත්වැඩියාකිරිම (Frama, FM-100 සහ Posmart යන්ත්‍ර සඳහා)
21. කාර්යාල සඳහා තිරරෙදි සැපයීම
22. මීයන්, වේයන් හා කෘමි පාලනය (Pest Control)
23. ස්ටිකර් මුද්‍රණය
24. සනීපාරක්ෂක සේවා (තැපැල් මූලස්ථාන කාර්යාලය සඳහා පමණි)
25. කුෂන් පුටු අළුත්වැඩියාව (Cushion Works)
26. ආරක්ෂක සේවා
27. මළු මත අකුරු මුද්‍රණයට Screen Printing සැපයීම
28. ඡායාපිටපත් යන්ත්‍ර කුලී පදනම මත සැපයීම
29. ගිනි නිවන උපකරණ සැපයීම හා නැවත පිරවීම.
30. අර්ධ වානේ තනි පොරව යතුරු සපයා ගැනීම.

31. කටු ඇමුණුම් යන්ත්‍ර සඳහා කම්බි රෝල් සපයා ගැනීම.
32. CCTV පද්ධති සැකසීම.
33. ඇඟිලි සලකුණු යන්ත්‍ර සැපයීම.
34. කාර්යාල සහ ගොඩනැගිලි අභ්‍යන්තර අලංකරණය සඳහා වන උපදේශන සේවා සහ එම කාර්යයන් (Interior Design & Supply)
35. ගොඩනැගිලි ඉදිකිරීම (ඍජු කොන්ත්‍රාත් හෝ Design Build ක්‍රමවේදය යටතේ)
36. සෝලා පද්ධති (Solar Systems) සවිකිරීම සහ නඩත්තු කිරීම.
37. ඩිජිටල් නාමපුවරු සැකසීම (Name Board)
38. ලයිට් බෝඩ් (Light Boards) සහ විවෘත කිරීමේ ඵලක (Opening Plaques) සැකසීම.
39. උත්සව කළමනාකරණය, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය උපකරණ සේවා සැපයීම.

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් - සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි -**

1. ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර තිබිය යුතුය. (අයදුම්පත සමඟ ලියාපදිංචි කිරීම් සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.)
2. මිල ගණන් කැඳවීමේදී සලකා බලනු ලබන්නේ ඒ ඒ ආයතන ලියාපදිංචි වූ පළාත් හා සැපයුම් කාණ්ඩය වන බැවින් ආයතනය ලියාපදිංචි වන කාණ්ඩය හා පළාත් පැහැදිලිව සඳහන් කල යුතුය.
3. අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ ඇමුණුම 01 හි ආකෘතියට අනුව සැකසූ ඉල්ලුම්පත් මගින් පමණි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් සලකා බලා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ තහවුරු කිරීමෙන් පසු දෙපාර්තමේන්තු සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබේ.
5. ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කිරීමෙන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගනු ලැබේ.
6. යම් අයිතමයන් යටතේ ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන් අතුරින් එක් සැපයුම්කරුවෙකුගෙන්, සැපයුම්කරුවන් කිහිප දෙනෙකුගේ හෝ සියලු ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා සැපයුම් ලබා ගැනීමට හෝ අවශ්‍යතාවය පරිදි ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමාල්බනයෙන් බැහැර සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා සැපයුම් ලබා ගැනීමටද තැපැල්පතිවරයා වෙත බලය පවතී. එම බලය තැපැල්පතිවරයා විසින් අවශ්‍යතාවය හා සුදුසුකම අනුව භාවිත කළ හැකි, අභියෝගයට ලක් කළ නොහැකි කොන්දේසි විරහිත බලයකි.
7. යම් සැපයුම්කරුවෙකුගේ සැපයීම් දුර්වල මට්ටමක පවතීනම්ද සැපයීම් කිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක හෝ යම් අක්‍රමිකතාවයක යෙදුනා යැයි තැපැල්පතිවරයාට හැඟී යන්නේනම්ද එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගතකර සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් නම කපා හැරීමේ සම්පූර්ණ බලය තැපැල්පති සතුවේ.
8. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි කළ සැපයුම්කරුවන්ගේ සැපයුම ලබා ගැනීම සම්බන්ධයෙන් රජය මේ දක්වා නිකුත් කර ඇති හා ඉදිරියේදී නිකුත් කල හැකි නීති රෙගුලාසි හා උපදෙස්වලට යටත්ව ලියාපදිංචි සැපයුම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. තවද, සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයේ හෝ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ සැපයුම් ලබාගැනීමේ කොන්දේසි ක්‍රියාපටිපාටි වල වෙනස්කම් සිදු කිරීමේ සම්පූර්ණ බලය දෙපාර්තමේන්තුව සතුවේ.
9. යම් ඇණවුමක් ලබාදීමෙන් පසු දින 30ක ගෙවීම් කාලයක් ලබා දිය යුතු අතර, අදාල ඇණවුම සපයා දීමේ දී දැරීමට සිදුවන ප්‍රවාහන ආදී යම් අමතර වියදමක් වේ නම් එය සැපයුම්කරු විසින් දැරිය යුතුය.

10. එක් පළාතක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු.**1000.00** (පළාත් එකක් හෝ කිහිපයක් සඳහා ලියාපදිංචි විය හැක) එක් අයිතමයක් සඳහා ගාස්තුව රු.**500.00**කි. **(විද්‍යුත් මුදල් ඇනවුමක් තැපැල්පති නමින් මුලස්ථාන තැපැල් කාර්යාලයෙන් මාරුකර ගත හැකි හැකි වන පරිදි හෝ මුලස්ථානයේ සරප් වෙත මුදලින් ගෙවීම සිදු කළ හැකිය)**.

ඔබගේ අයදුම්පත් ආදර්ශ අයදුම්පත අනුව සකසා **2026.10.23** දින **ප.ව.2.00** ට පෙර ලැබෙන සේ ගණකාධිකාරී(ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, (06 වන මහල) තැපැල් මුලස්ථානය, 310, ඩී.ආර්.විජයවර්ධන මාවත, කොළඹ 01000 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එම ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට පිළිවන. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2027 "** යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩි තොරතුරු 011 4927249 දුරකථනයෙන් "ගණකාධිකාරී (ප්‍රසම්පාදන) " ඇමතීමෙන් ලබා ගත හැක.

තැපැල්පති,
තැපැල් මුලස්ථානය,
310,ඩී.ආර්.විජයවර්ධන මාවත,
කොළඹ 01000,
2026.09.22

ඇමුණුම 01

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

### ආදර්ශ අයදුම් පත්‍රය

01. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පළාත -:
(තෝරාගනු ලබන පළාත / පළාත් සඳහා කතිරය සළකුණු කරන්න.)

02.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | B | C | D | E | F | G | H | I |

අයදුම් කරනු ලබන අයිතමය -:
(තෝරාගනු ලබන අයිතමය / අයිතමයන් සඳහා කතිරය සළකුණු කරන්න.)

භාණ්ඩ -:

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 | 41 | | | | |

සේවා -:

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |
| 29 | 30 | 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | | | |

02. ආයතනයේ නම-:

03. ආයතනය ලියාපදිංචි කර ඇති ස්වභාවය හා අංකය -:
(ආයතනය ලියාපදිංචි ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.)

04. ආයතනයේ ලිපිනය -:

05. දුරකථන අංකය / ෆැක්ස් අංකය / ඊමේල් ලිපිනය -:

06. වැට් බදු අයකරන්නේ නම් පැහැදිලිව, ලියාපදිංචි අංකය සඳහන් කළ යුතුය-:

07. ආයතනයේ සම්බන්ධීකරණ නිලධාරීන්ගේ තොරතුරු නම, දුරකථන අංකය, ඊමේල් ලිපිනය -:

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් තැපැල් දෙපාර්තමේන්තුවේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2027"** සඳහා අදාල වන සුදුසුකම් හා කොන්දේසි කියවා බලා නිසි ආකාරයෙන් තේරුම් ගෙන ඒ පරිදි කටයුතු කිරීමට එකඟවන බවත් ප්‍රකාශ කර සිටිමි.

නම :- ............................................................

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................

අයදුම්කරුගේ අත්සන හා මුද්‍රාව